අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය

General Certificte of Education (Adv. Level) Examination

ආදර්ශ ප්‍රශ්න පත්‍රය 1 - II පත්‍රය

| සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය | 29 | S | II | කාලය පැය 03 |
|---|---|---|---|---|

(01) පාසලක දේශනයක දී ඉදිරිපෙළ ආසනවල සිටි ළමුන් ඉතා උදාසීනවත්, පසුපස ආසනවල සිටි ළමුන් එකිනෙකා හා කතාබහ කරමිනුත් කාලය ගත කරන බවක් දක්නට ලැබිණි.

i. දේශනය අසාර්ථක වීමට බලපෑ දේශකයාගේ දුබලතා හතරක් සඳහන් කරන්න.
(ල.02)

ii. සමූහ සන්නිවේදනයේ සාර්ථකත්වය සඳහා ග්‍රාහකයා දායක විය යුතු ආකාර හතරක් කෙටියෙන් විස්තර කරන්න.
(ල.04)

iii. සමූහ සන්නිවේදන අවස්ථාවක දී මතුවිය හැකි ප්‍රධාන බාධක වර්ග දෙක නිදසුන් සහිතව පැහැදිලි කරන්න.
(ල.06)

iv. සමූහ සන්නිවේදනය හා ජන සන්නිවේදනය අතර වෙනස මූලික සාධක 4ක් ඇසුරින් විස්තර කරන්න.
(ල.08)

(02) දේශපාලන ප්‍රචාරක කටයුතු සිදු කරන විවිධ ආකාර පිළිබඳව මැතිවරණ සමයේ දී සාකච්ඡාවට භාජනය විය.

i. දේශපාලන පදනමක් මත ඉදිරිපත් වී ඇති හැරල්ඩ් ඩී. ලැස්වෙල්ගේ සන්නිවේදන නිර්වචනය දක්වන්න.
(ල.02)

ii. මැතිවරණ ප්‍රචාරණයේ දී වඩා වැදගත් වන්නේ පුද්ගලාන්තර සන්නිවේදනය බව සාකච්ඡාවේ දී තීන්දු කෙරිණි. පුද්ගලාන්තර සන්නිවේදනයේ ප්‍රබලත්වය කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න.
(ල.04)

iii. දේශපාලන ප්‍රචාරණය සඳහා නව මාධ්‍ය භාවිතයේ වැදගත්කම සාකච්ඡා වුණි. ඒ සඳහා යොදා ගත හැකි නව මාධ්‍ය විධික්‍රම තුනක් විස්තර කරන්න.
(ල.06)

iv. දේශපාලන රැලියක් පිලිබඳ පෝස්ටරයක අඩංගු විය යුතු කරුණු හතරක් නම් කර, පෝස්ටර් මාධ්‍යයේ වැදගත්කම කරුණු තුනක් ඇසුරින් විස්තර කරන්න.
(ල.08)

(03)

i. පුද්ගලාන්තර සන්නිවේදනය සඳහා භාවිත කළ හැකි නව මාධ්‍ය විධික්‍රම හතරක් දක්වන්න.
(ල.02)

ii. ජන ජීවිතයේ දී ජන ගී වැදගත් වන ආකාරය පිළිබඳ කරුණු **හතරක්** දක්වා ඉන් **එකක්** ගැන කෙටියෙන් විස්තර කරන්න.
(ල.04)

iii. විනෝදාස්වාදය සැපයීම, අධ්‍යාපනය ලබා දීම, තොරතුරු බෙදා හැරීම ආදී කාර්යයන්ට අමතරව ජනමාධ්‍ය මගින් ඉටුවන සුවිශේෂී කාර්යයන් හතරක් දක්වා, ඉන් දෙකක් පැහැදිලි කරන්න.
(ල.06)

iv. ජනසන්නිවේදන ක්‍රියාවලිය පිළිබඳ ඉදිරිපත් වී ඇති ජනසන්නිවේදන ආකෘතියෙහි ක්‍රියාවලිය කෙටියෙන් පැහැදිලි කර, එහි ඇතුළත් මූලික අංග **හතරක්** සඳහන් කර,**දෙකක්** කෙටියෙන් විස්තර කරන්න
(ල.08)

(04)

i. අන්තර් පුද්ගල සන්නිවේදනයේ යනු කුමක්දැයි එම ප්‍රභේදයට විශේෂිත කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න.
(ල.02)

ii. ශ්‍රාම් ඔස්ගුඩ් සන්නිවේදන ආකෘතියෙහි අන්තර්ගත ප්‍රධාන කරුණු දෙකක් වන ආකේතිකරණය හා විකේතිකරණය වෙන වෙනම විස්තර කරන්න.
(ල.04)

iii. සන්නිවේදකයා මෙන්ම ග්‍රාහකයාද එක සේ වැදගත් වන ආකෘතිය ඇඳ එහි සන්නිවේදක හා ග්‍රාහකස්ථාන පැහැදිලි කරන්න.
(ල.06)

iv.




ඉහත දැක්වෙන ආකෘතිය නම් කරන්න. 1,2,3,4,5,6 නම් කරන්න. සන්නිවේදන ක්‍රියාවලියේ දී මූලික අංගයක් වන 6 හි ප්‍රභේද දක්වා ඒවා පිළිබඳ සැලකිලිමත්වීමේ වැදගත්කම පැහැදිලි කරන්න.
(ල.08)

(05)

i. ජනමාධ්‍ය වර්ගීකරණය ඇඳ දක්වන්න.

ii. ගුවන්විදුලි මාධ්‍යයේ විශේෂතා දෙකක් නම් කර පැහැදිලි කරන්න.

iii. පුවත්පත සෙසු ජනමාධ්‍යවලින් වෙනස්වන ආකාර හතරක් දක්වා ඉන් දෙකක් පැහැදිලි කරන්න.

iv. රූපවාහිනියේ ප්‍රචාරය වන ආහාර දැන්වීම් මගින් පාරිභෝගිකයාට සිදුවන බලපෑම කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න.

(06)

i. සංස්කෘතිය යනු අංග රැසක එකතුවකි. **බී මැලිනොවුස්කි** නම් මානව විද්‍යාඥයාගේ අර්ථකථනයට අනුව සංස්කෘතියක අන්තර්ගත මූලික අංග 4ක් නම් කරන්න.

ii. මාධ්‍ය සංස්කෘතියේ ලක්ෂණ හතරක් නම් කර ඉන් එකක් පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න.

iii. ජනප්‍රිය සංස්කෘතියේ මූලික ලක්ෂණ හතරක් නම් ඉන් දෙකක් පිළිබඳ විස්තර කරන්න.

iv. මාධ්‍ය සංස්කෘතිය නිසා සිදුවන සමාජ වෙනස්වීම් මැයෙන් රචනාවක් ලියන්න.

නලිනිකා ලක්ෂාණි